# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2085/36 - 2018 අගෝස්තු මස 24 වැනි සිකුරාදා - 2018.08.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2018 අගෝස්තු මස 25 වැනි දින සිට ආරම්භ වන මාස 06 ක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2018.06.14 දිනැති අංක 2075/31 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 0801.19.90 යටතේ වන පොල් මද සහ 2018.05.31 දිනැති අංක 2073/37 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 15.07, 15.11, 15.12 සහ 15.13 යටතේ වන එළවළු/පාම් තෙල් සඳහා ප්‍රකාශිත අදාළ නියමයන් 2018 අගෝස්තු මස 25 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2018 අගෝස්තු මස 24 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | |
| | *සං. ව. ශීර්ෂය* | *සං. ව. සංකේතය* | *විස්තරය* | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| 1. | 15.07 | | **ශුද්ධ කළ හෝ නොකළ නමුත් රසායනිකව නවීකරණය නොකළ, සෝයා බෝංචි තෙල් සහ ඒවායේ ඉතිරි වූ කොටස්.** | |
| | | 1507.10 | මැලියම් ඉවත් කළ හෝ නොකළ අශුද්ධ තෙල් | කි. ග්‍රෑමයට රු. 150.00 |
| | | 1507.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 170.00 |
| | 15.11 | | **ශුද්ධ කළ හෝ නොකළ, නමුත් රසායනිකව නවීකරණය නොකළ පාම් තෙල් සහ ඒවායේ ඉතිරි වූ කොටස්.** | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | |
| | *සං. ව. ශීර්ෂය* | *සං. ව. සංකේතය* | *විස්තරය* | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | | 1511.10 | ශුද්ධ නොකළ තෙල් | කි. ග්‍රෑමයට රු. 150.00 |
| | | 1511.90 | අනෙකුත් : | |
| | | 1511.90.10 | කාමර උෂ්ණත්වයේ ඇති අනුක්‍රමික කොටස් (පාම් ස්ටියරින්) | කි. ග්‍රෑමයට රු. 150.00 |
| | | 1511.90.20 | ලීටර් 210 හෝ ඊට අඩු ප්‍රමාණයන්ගෙන් අසුරා ආනයනය කරනු ලබන පාම් තෙල් | කි. ග්‍රෑමයට රු. 175.00 |
| | | 1511.90.30 | ශුද්ධ නොකළ පාම් ඔලේන් | කි. ග්‍රෑමයට රු. 155.00 |
| | | 1511.90.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 175.00 |
| | 15.12 | | **ශුද්ධ කළ හෝ නොකළ, නමුත් රසායනිකව නවීකරණය නොකළ සූර්යකාන්ත ඇටවල තෙල්, සෆ්ෆ්ලවර් හෝ කපු ඇට තෙල් සහ ඒවායේ ඉතිරි වූ කොටස්.** | |
| | | | **සූර්යකාන්ත ඇටවල තෙල් හෝ සෆ්ෆ්ලවර් තෙල් සහ ඒවායේ ඉතිරි වූ කොටස්.** | |
| | | 1512.11 | ශුද්ධ නොකළ තෙල් | කි. ග්‍රෑමයට රු. 150.00 |
| | | 1512.19 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 170.00 |
| | 15.13 | | **ශුද්ධ කළ හෝ නොකළ, නමුත් රසායනිකව නවීකරණය නොකළ, පොල් (කොප්පරා) පාම් ගෙඩි මද හෝ බාබසු තෙල් හා ඒවායින් ඉතිරි වූ කොටස්.** | |
| | | | | |
| | | | **පොල් (කොප්පරා) තෙල් හා ඉන් ඉතිරි වූ කොටස් :** | |
| | | 1513.11 | අශුද්ධ තෙල් : | |
| | | | තොග වශයෙන් : | |
| | | 1513.11.11 | අදූෂිත පොල් තෙල් | කි. ග්‍රෑමයට රු. 170.00 |
| | | 1513.11.19 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 170.00 |
| | | | අනෙකුත් : | |
| | | 1513.11.21 | අදූෂිත පොල් තෙල් | කි. ග්‍රෑමයට රු. 170.00 |
| | | 1513.11.29 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 170.00 |
| | | 1513.19 | අනෙකුත් : | |
| | | 1513.19.10 | තොග වශයෙන් | කි. ග්‍රෑමයට රු. 170.00 |
| | | 1513.19.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 170.00 |
| | | | **පාම් ගෙඩි මද හෝ බාබසු තෙල් හා ඒවායින් ඉතිරි වූ කොටස් :** | |
| | | 1513.21 | අශුද්ධ තෙල් | කි. ග්‍රෑමයට රු. 170.00 |
| | | 1513.29 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 185.00 |

09 - 242

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.